කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

11 ශ්‍රේණිය | ගෘහ ආර්ථික විද්‍යාව 11 | කාලය පැය 02 යි

**පළමු වන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1) පහත සදහන් සිද්ධිය අධ්‍යයනය කර , දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

ගර්භණී දුවක් සහ තරුණ පුතෙකු සිටින ගුරු මහත්මියක් මෑතකදී විශ්‍රාම ගැනීමට නියමිතය. ඒ සඳහා 50 දෙනෙකුට පමණ ආරාධනා කර දිවා භෝජන සංග්‍රහක් පැවැත්වීමට ද ඇය සූදානමින් සිටී.

1.1 එම දිවා භෝජන සංග්‍රහය සඳහා සුදුසු භොජුන් පතක් නිර්මාණය කරන්න.
(ලකුණු 02)

1.2 ඇයගේ දියණිය සඳහා සුදුසු උදෑසන ආහාර වේලක් සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු 04 ක් සඳහන් කරන්න.
(ලකුණු 02)

1.3 ඉහත දිවා භෝජන සංග්‍රහයේ දිවා ආහාරය සඳහා සුදුසු පරිරක්ෂිත ආහාර වර්ගයක් සකසන අයුරු ගැලීම් සටහනකින් දක්වන්න.
(ලකුණු 02)

1.4 එම භෝජන සංග්‍රහයේදී මාළු බැදීම සඳහා ගෙන ආ තෙල් "මුඩු" වී ඇති බව ඇය පැවසීය. තෙල් "මුඩු" වීම යනු කුමක්දැයි පහදන්න.
(ලකුණු 02)

1.5 දියණියගේ අළුත ඉපදීමට සිටින ළදරුවා සඳහා ඇඳුම් මැසීමට පෙර රෙදි පිරියම් කිරීමේ ක්‍රම 02 ක් ලියන්න.
(ලකුණු 02)

1.6 ළදරු ඇඳුම් නිර්මාණයේදී පතරොම භාවිතා කිරීමෙන් සැලසෙන වාසි 02 ක් ලියන්න.
(ලකුණු 02)

1.7 ඉහත තරුණ පුතුගේ කාමරය බද්ධ වර්ණ සංයෝගය මගින් සකසා ගත හැකි අයුරු ලියන්න
(ලකුණු 02)

1.8 තම වත්තෙහි පස ඛාදනයට ලක්ව ඇති බව ගුරුමහත්මිය දුටුවාය. සෝදා පාළුවෙන් පස ආරක්ෂා කරගත හැකි ක්‍රම 02 ක් ලියන්න. (ලකුණු 02)

1.9 එම ගර්භණී දියණියගේ යකඩ අවශ්‍යතාවය වැඩි වීමට හේතු 02 ක් ලියන්න.
(ලකුණු 02)

1.10 ගර්භණී භාවය ස්ථිර වශයෙන් තහවුරු කර ගත හැකි වෛද්‍ය පරීක්ෂණය කුමක්ද?
(ලකුණු 02)

2) i. මැසීමේ ශිල්පීය ක්‍රම 3 ක් නම් කරන්න.
ii. බොරු නූල් ඇදීම යොදා ගන්නා අවස්ථා 3 ක් සඳහන් කරන්න.
iii. ප්‍රංශ මූට්ටුව මසන අයුරු රූප සටහන් සහිතව පැහැදිලි කරන්න.

3) i. ඌනතා රෝග යනුවෙන් කුමක් අදහස් වේද? පැහැදිලි කරන්න.
ii. පෝෂණමය නීරක්තිය හා පෝෂණමය නොවන නීරක්තිය ඇතිවිට බලපාන හේතු 03 බැගින් ලියන්න.
iii. ශ්‍රී ලංකාවේ අයඩින් ඌනතාව ළමා, යොවුන්, ගර්භණී අවධි සඳහා ඇති කරන අහිතකර බලපෑම් වෙන වෙනම වගුවකින් ඉදිරිපත් කරන්න.

4) i. ළමා ගවුමක් නිර්මාණය කිරීමේදී සැළකිළිමත් විය යුතු කරුණු 03 ක් දක්වන්න.
ii. මුල් ළමාවියෙහි ගැහැණු ළමයෙකුගේ ගවුමක පතරොම නිර්මාණය කිරීමේදී පපුව මිනුම ඉදිරිපස හා පිටුපස ගණනය කරන අයුරු ලියා දක්වන්න.
iii. ළමා ගවුමේ මූලික අත උපයෝගී කරගෙන බෝරිච්චි අතක් නිර්මාණය කරන අයුරු දළ රූප. සටහන් මගින් පැහැදිලි කරන්න

5) i. ආහාර ජීරණය යනු කුමක්ද ? අර්ථ දක්වන්න.
ii. ආහාර ජීරණය කෙරෙහි බලපාන සාධක 3 ක් සඳහන් කරන්න.
iii. ආහාර ජීරණ පද්ධතියේ දළ රූප සටහනක් ඇද කොටස් 5 ක් නම් කරන්න.

6) i. කළමණාකරණ ක්‍රියාවලියේ පියවර නම් කරන්න.
ii. මානව සම්පත් 03 ක් නම් කර එය උපයෝගී කරගන්නා අවස්ථාව බැගින් සඳහන් කරන්න.
iii. මව පියා හා පාසල් යන දියණියන් දෙදෙනෙකු සිටින පවුලක් කුඩා නිවසක ජීවත් වේ. එම පවුලේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා එම කුඩා නිවස සංවිධානය කර ගැනීමට යෝජනා 04 ක් ඉදිරිපත් කරන්න.

7) i. ආහාර නරක් වීම යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.
ii. ආහාර නරක් වීම කෙරෙහි බලපාන ජීව විද්‍යාත්මක හේතු 02 ක් සඳහන් කර ඊට උදාහරණ දක්වන්න.
iii. ආහාර පරිරක්ෂණය කිරීමෙන් ඇති වන වාසි 04 ක් සඳහන් කරන්න.